ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2357/37 – 2023 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා – 2023.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2020/151.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.02.25 දිනැති හා අංක 2268/81 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2022.02.15 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හෝමාගම, කටුවාන, දහම් මාවත, අංක 310/6 හි පදිංචි එච්. ජේ. ආර්. ද සිල්වා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල්, කොබ්බෑකඩුව මාවත, අංක 234 හි පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.06.02 දිනැති A11/2022 දරන ප්‍රදානය පළකරනු ලැබූ 2023.06.27 දිනැති හා අංක 2338/20 දරන *ගැසට්* නිවේදනයේ දෝෂ නිවැරදි කිරීම සඳහා 2023.10.06 දිනැති සංශෝධිත ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ඔක්තෝබර් මස 17 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 40699– 13 (2023/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2023 ජුනි මස 27 දින 2338/20 දරන අතිවිශෙෂ ගැසට්පත්‍රයේ පළකරන ලද නිවේදනයේ දෝෂ නිවැරදි කිරීම**

**බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය**

එච්. ජේ. ආර්. ද. සිල්වා මයා,
අංක 310/6, දහම් මාවත,
කටුවාන, හෝමාගම.

*යොමු අංකය ඃ IR/COM/03/2020/151*
නඩුඅංකය A/11/2022

*පළමුවැනි පාර්ශ්වය.*

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

*දෙවැනි පාර්ශ්වය.*

*අතර පවතින ආරාවුල*

**ප්‍රදාන පත්‍රයේ දෝෂ නිවැරදි කිරීම**

2023 ජුනි මස 27 වන දින ප්‍රසිද්ධ කරන ලද අංක 2338/20 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද උක්ත ආරාවුල පිළිබඳව ප්‍රදානයේ අවසන් ජේද පහත සඳහන් මුද්‍රණ දෝෂ නිවැරදි විය යුතුය.

මේ අනුව 2019.06.21 වන දිනට පරිපාලන නිලධාරී තනතුරට හිමි වැටුප රු. 39,539.00 ක් බව සඳහන් කරන අතර ඉල්ලුම්කාරියට ගෙවිය යුතු වැටුප් සහ සියළුම ව්‍යවස්ථාපිත දීමනා සහ හිඟ වැටුප් ද සමග සියළු දීමනා ගණනය කොට මෙය *ගැසට්* ගත කිරීමෙන් මසක් ඇතුළත ඉල්ලුම්කාරියට ගෙවීම සඳහා විස්තර ඇතුළත් ලේඛනය සමග මුළු මුදල සහකාර කම්කරු කොමසාරිස් නැගෙනහිර කොළඹ කාර්යාලය වෙත තැන්පත් කළ යුතු බවට නියම කරමි.

හිඟ වැටුප් සහ සියළු දීමනා ඇතුළුව ගෙවිය යුතු විස්තර ඇතුළත් ලේඛනය මාසයක් තුළ මෙම බේරුම්කරණයට ඉදිරිපත් කළ යුතු බවටද නියම කරමි.

තව ද එම ප්‍රදානයේ ඇතුළත් අනෙකුත් කරුණුවල වෙනසක් නොමැති බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

**ආර්. නවෝදයම්,**
බේරුම්කරු.

2023 ඔක්තෝබර් මස 06 වැනි දින,
බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේදීය.

EOG 11 - 0077

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.